සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 14 S

## කතෝලික ධර්මය

නම ..............................................

කාලය පැය දෙකයි

උපදෙස් : සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න,

### I - කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමට අයත් පොත් කාණ්ඩයකි.
    1. ශුභාරංචි පොත් 2. හසුන්පත් 3. සාමාන්‍ය ලිපි 4. ඉතිහාස පොත්

02. පැරණි ගිවිසුමේ මුල් පොත් පහ හඳුන්වනු ලබන්නේ,
    1. දිවැසිවර ග්‍රන්ථ නමිනි 2. ඉතිහාස පොත් නමිනි
    3. පංච පුස්තකය නමිනි 4. ප්‍රඥා සාහිත්‍ය නමිනි

03. ජේසුස් වහන්සේ කළ හා කී දේවල් සමහරක් ඇතුළත් වනුයේ,
    1. සුභාරංචි ග්‍රන්ථවලය 2. ඉතිහාස පොත්වලය
    3. දිවැසිවර ග්‍රන්ථවලය 4. ප්‍රඥා සාහිත්‍ය පොත්වලය

04. මුල් කිතුනු සභාවේ වර්ධනයට දායක වූ පුද්ගලයින් දෙදෙනෙකි.
    1. පේදුරු හා ජොහාන් 2. පේදුරු හා ජාකොබ් 3. පේදුරු හා පාවුලු 4. ජාකොබ් හා පාවුලු ය

05. මුල් කිතුනු සභාවට මෙන්ම සෑම කාලයකටම උචිත වටිනා ඉගැන්වීම් රැසක් අන්තර්ගතව ඇත්තේ,
    1. ශුභාරංචි ග්‍රන්ථවලය 2. සංදේශ පොත්වලය
    3. එළිදරව් ග්‍රන්ථවලය 4. නීති පොත්වලය

06. විශ්වාසකයින් දිරිගැන්වීම සඳහා සංකේත භාවිතයෙන් ලියා ඇති ග්‍රන්ථයකි,
    1. රෝම 2. කොරින්ති 3. තීතස් 4. එළිදරව්ව

07. ශුද්ධ බයිබලයේ යාච්ඤා පොත ලෙස හඳුන්වනු ලැබේ.
    1. හිතෝපදේශය 2. ගීතාවලිය 3. උපදේශකයා 4. ධර්මෝපදේශකයා

08. ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීම සඳහා ජනතාවට මඟ පෙන්වන ඉගැන්වීම් අන්තර්ගත වනුයේ,
    1. ප්‍රඥාගීතිකා තුළය 2. තුති දීමේ ගීතිකා තුළය 3. ප්‍රශංසා ගීත තුළය 4. විලාප ගීතිකා තුළය

09. ජෙරුසලමට භාවිතා වන තවත් නමකි.
    1. සියොන් 2. බෙතෙල් 3. ගිබියොන් 4. බෙතෙස්දා

10. ගීතාවලියෙන් ගන්නා ලද ගීතිකා භාවිතා වන අවස්ථාවකි.
    1. පාදනමස්කාරය 2. නුවානය 3. සැඳෑයාම යැදුම 4. ජපමාලය

11. මතෙව්, මාක්, ලූක් ශුභාරංචි හැඳින්වීමට යෙදෙන පොදු නම උච්චාරණය වන්නේ,
    1. පංච පුස්තකය නමිනි. 2. සමදර්ශක ශුභාරංචිය නමිනි.
    3. දේව රාජ්‍යයේ ශුභාරංචි නමිනි. 4. ශුභාරංචි ග්‍රන්ථ නමිනි.

12. ජේසුස් වහන්සේ නව මෙසියානික ගුරුවරයා බව පෙන්වා දීම අරමුණු කරගත් ශුභාරංචි කතුවරයා,
   1. ශුද්ධවර ලුක්තුමාය
   2. ශුද්ධවර මතෙව්තුමාය
   3. ශුද්ධවර ජොහාන්තුමාය
   4. ශුද්ධවර මාක් තුමාය

13. දුක්ප්‍රාප්තියේ ශුභාරංචිය වන්නේ,
   1. මාක් ය
   2. ලුක් ය
   3. ජොහාන් ය
   4. මතෙව් ය

14. "නුඹ යම් දවසක ඒ ගසින් කන්නෙහි ද? ඒ දවසෙහි ......... නුඹට ඒකාන්තය." හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
   1. ලෙඩදුක්
   2. මරණය
   3. කරදර
   4. ආදරය

15. අප වරදක් කළ විට දෙමාපියන් අපට දඬුවම් කරන්නේ,
   1. අපව හොඳින් හදා ගැනීමටය
   2. අපට ඇති ආදරය නිසා ය
   3. දෝෂාරෝපණ වලින් බේරීමටය
   4. අන් අයගෙන් බැනුම් අසන නිසාය

16. දෙවියන් වහන්සේ අපට කරුණාව දක්වන බැවින් අප ද අන්අයට,
   1. ප්‍රේම කරමු
   2. දයාව දක්වමු
   3. කරුණාව දක්වමු
   4. සමාව දෙමු

17. මැවිල්ලේ මුදුන් මල්කඩ වනුයේ,
   1. ඉර හඳ ය
   2. සාගරය ය
   3. පොළව ය
   4. මිනිසා ය

18. පාපී ක්‍රියා,
   1. මුළු මැවිල්ලටම විනාශකාරී ලෙස බලපායි
   2. ආදම් ඒවට දඬුවම් ලැබීමට බලපායි
   3. මුළු මිනිස් සංහතියට බලපායි
   4. සමාජ සංවර්ධනය අඩාල වීමට බලපායි

19. නව මැවිල්ලක ආරම්භකයා ලෙස දෙවියන් වහන්සේ විසින් තෝරා ගනු ලැබුවේ,
   1. ආබෙල්ය
   2. නෝවාය
   3. කායින්ය
   4. ආබ්‍රහම්ය

20. දෙවියන් වහන්සේ නෝවාට දුන් පොරොන්දුව ඒ ආකාරයෙන් ම සඵල වූයේ,
   1. අහස පියවි වැස්ස නොවැටුණ නිසා ය
   2. ජලගැල්ම නැවතුන නිසා ය
   3. නෝවා ජල ගැල්මෙන් බේරීම නිසා ය
   4. සියලු වර්ගයේ සතුන් නැවට ගත් නිසා ය

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. ප්‍රශ්න සියල්ලට ම කෙටි පිළිතුරු සපයන්න.
   1. ඉතිහාස පොත් 02 ක් නම් කරන්න.
   2. ශුද්ධවර පාවුළුතුමා පුද්ගලයන් වෙත යැවූ හසුන් 02 ක් නම් කරන්න.
   3. විලාප ගීතිකා කොටස් දෙකකි. ඒවා නම් කරන්න.
   4. ගීතාවලියේ ගීතිකා ක්‍රිස්තුන් වහන්සේ විසින් භාවිතා කර ඇති අවස්ථා 02 ක් ලියන්න.
   5. ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය ප්‍රකාශ වන "මම වෙමි" ප්‍රකාශ 02 ක් ලියන්න.
   6. ඒවට හිමි වූ පාපයේ ප්‍රතිඵල 02 ක් ලියන්න.
   7. ආදම් සහ ඒවට හම් වස්ත්‍ර සාදා දීමෙන් පෙන්නුම් කරන දේව ගුණාංග 02 ක් ලියන්න.
   8. කායින් සහ ආබෙල් දෙවියන් වහන්සේට පූජා කළ පඬුරු 02 ක් නම් කරන්න.
   9. වර්තමාන සමාජයේ පවතින පාපී ක්‍රියා 02 ක් ලියන්න.
   10. නෝවාගේ පුතුන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

02. 1. නව ගිවිසුමට අයත් පොත් කාණ්ඩ 02 ක් නම් කරන්න. (ල. 02)
2. දිවැසි පොත් තුනක් නම් කරන්න. (ල. 03)
3. ශුද්ධ ලියවිල්ල තුළින් ඔබේ ජීවිතය හරිමඟ ගෙනයාමට ගත හැකි ආදර්ශ 05 ක් ලියන්න. (ල. 05)

03. 1. ශුද්ධවර ලූක්තුමා විසින් රචිත ග්‍රන්ථ දෙක නම් කරන්න. (ල. 02)
2. නව ගිවිසුමෙහි ඇතුළත් සන්දේශ 03 ක් ලියන්න. (ල. 03)
3. නව ගිවිසුම තුළ අපට හමුවන ක්‍රිස්තුන් වහන්සේගෙන් ලබා ගත හැකි ජීවිතාදර්ශ 05 ක් ලියන්න.(ල. 06)

04. 1. ගීතාවලිය හඳුන්වන වෙනත් නම් 02 ක් ලියන්න. (ල. 02)
2. ගීතාවලියේ ප්‍රශංසා ගීතවල සඳහන් දෙවියන් වහන්සේගේ ගුණාංග 03 ක් නම් කරන්න. (ල. 03)
3. ඔබ ලැබූ අත්දැකීමක් ඇසුරෙන් දෙවියන් වහන්සේට ප්‍රශංසා කර යැදුමක් ලියන්න. (ල. 05)

05. 1. ආදම් සහ ඒවගේ පුතුන් දෙදෙනා නම් කරන්න. (ල. 02)
2. අප වැරදි කරන විට අපට හරි මඟ පෙන්වන පුද්ගලයන් තිදෙනෙක් ලියන්න. (ල. 03)
3. දුර්පරීක්ෂාවක් පැමිණි විට එය ජයගැනීමට කිතුනු සිසු දරු ඔබට කළ හැකි දේවල් 05 ක් ලියන්න.(ල. 05)

06. 1. ජලගැල්මෙන් පසු දෙවියන් වහන්සේ සමඟ ගිවිසුමට ඇතුළත් වූ කණ්ඩායම් 02 ක් නම් කරන්න.(ල. 02)
2. පුරාණ ගිවිසුම තුළ දේදුන්නෙන් සංකේතවත් වූ අදහස් 03 ක් ලියන්න. (ල. 03)
3. නෝවා මෙන් සත් ගුණවත් මිනිසෙක් ලෙස ජීවත් වීමට ක්‍රියා කළ යුතු ආකාරය කරුණු 05 කින් ලියන්න. (ල. 06)

# පළමු වාර පරීක්ෂණය - 2019

## 9 ශ්‍රේණිය කතෝලික ධර්මය (පිළිතුරු පත්‍රය)

I - කොටස

01. (4) 1 පිටුව 02. (3) 2 පිටුව 03. (1) 7 පිටුව 04. (3) 7 පිටුව 05. (2) 8 පිටුව
06. (4) 8 පිටුව 07. (2) 5 පිටුව 08. (3) 12 පිටුව 09. (1) 13 පිටුව 10. (3) 14 පිටුව
11. (2) 15 පිටුව 12. (2) 16 පිටුව 13. (1) 17 පිටුව 14. (2) 21 පිටුව 15. (2) 23 පිටුව
16. (3) 24 පිටුව 17. (4) 30 පිටුව 18. (1) 32 පිටුව 19. (2) 32 පිටුව 20. (3) 32 පිටුව

(ලකුණු 2 x 20 = 40)

II - කොටස

01. 1. ජෝෂුවා, විනිශ්චයකාරයෝ, රූත් 1, 2 සාමුවෙල් ඉතිහාස පොත් 16 න් ඕනෑම 2 ක් (පිටුව 2)
2. තිමෝති, තීතස්, පිලමොන් (7, 8 පිටු)
3. පෞද්ගලික විලාප ගීතිකා/ජාතික හෝ සාංඝික ආයාචනා (පිටුව 12)
4. කන්ද උඩ දේශනය /කුරුස ගසේ දී (14 පිටුව)
5. "සැබෑ මිදිවැල මම වෙමි" "ලෝකයේ ආලෝකය මම වෙමි" ප්‍රකාශ 7 න් ඕනෑම 2 ක් (18, 19, 20 පිටු)
6. ගැබ් ගැනීම වේදනාවක් වීම/විලිරුදාව ඇතිව දරුවන් බිහිකිරීම (පිටුව 23)
7. කරුණාව, ආදරය, රැකවරණය මින් 2 ක් (පිටුව 24)
8. අස්වැන්න/බැටළු පැටවුන් (පිටුව 26)
9. සොරකම/ඊර්ෂ්‍යාව/ළමා අපචාර යනාදී ඕනෑම 2 ක් (පිටුව 31)
10. ෂෙම්, හාම්, ජපෙත් මින් දෙදෙනෙක් (පිටුව 32)

02. 1. ශුභාරංචි හා ක්‍රියාපොත/සංදේශ/එළිදරව් සාහිත්‍ය මින් දෙකක් (පිටුව 07)
2. යෙසායා, ජෙරමියා, එසකියල් යනාදි 17 න් තුනක් (පිටුව 03)
3. ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න

03. 1. ලූක් ශුභාරංචිය හා අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත
2. රෝම, කොරින්ති, එපිස, ගලාති සංදේශ 21 ඕනෑම 3 ක් (පිටුව 7, 8)
3. ප්‍රේමය, සමාව දීම, යාච්ඤාවේ ජීවිතය, අසරණයන්ට පිහිට වීම, දයානුකම්පාව/යනාදි ආදර්ශ 05 ක්

04. 1. "ගී කළඹ" ඊශ්‍රායෙල් ජනතාවගේ යැදුම් පොත (පිටුව 11)
2. යහපත්කම, උදාරත්වය, කරුණාව, දයාව, රාජකීයත්වය මින් 03 ක් (පිටුව 11)
3. දේව ආදරය හා බැඳුන ඕනෑම අත්දැකීමක් මුල් කරගත් ප්‍රශංසා යැදුමක් ලියා ඇත්නම් ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න.

05. 1. කායින් / ආබෙල් (පිටුව 26)
2. ආගමික නායකයින් / දෙමාපියන් / ගුරුවරුන් /වැඩිහිටියන් මින් තුනක් (පිටුව 27)
3. හෘද සාක්ෂියට සවන් දීම / එයට අවනත වීම / ජේසුස් වහන්සේව අනුගමනය කිරීම / යාච්ඤා කිරීම ශිෂ්‍යයා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු දෙන්න.

06. 1. සියලු සතුන්/නෝවාගේ පවුලේ අය (පිටුව 34)
2. දේව අනුකම්පාව/කරුණාව/ප්‍රේමය (පිටුව 35)
3. අවංකව ජීවත්වීම/ධර්මිෂ්ඨව ජීවත් වීම සඳහා කරන ක්‍රියා ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

ලකුණු ( 2+3+5=10)